යූබී ෆිනෑන්ස් පීඑල්සී

- අර්නස්ට් ඇන්ඩ් යංග් විගණන ආයතනය විසින් 2023/24 වර්ෂය සඳහා නිකුත් කරන ලද විගණන වාර්තාවේ සිංහල පරිවර්තනය පහත දැක්වේ.
- මෙහි භාෂා අතර යම් අනනුකූලතාවයක් (වෙනසක්) ඇති වුවහොත් ඉංග්‍රීසි බසින් පලකළ වාර්තාව බලපැවැත්වේ.

ස්වාධීන විගණකගේ වාර්තාව
යූබී ෆිනෑන්ස් හි කොටස් හිමියන් වෙත

මූල්‍ය ප්‍රකාශනවල විගණනය පිළිබඳ වාර්තාව

EY
Building a better working world

Ernst & Young
Chartered Accountants
Rounda Towers
No. 109, Galle Road,
P.O. Box 101
Colombo 03, Sri Lanka

Tel : +94 11 246 3500
Fax : +94 11 768 7869
Email : eysl@lk.ey.com
ey.com

HLF/WDPL/IP/NR/DRM

මතය

2024 මාර්තු 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ආදායම් ප්‍රකාශනය, විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශවලට අදාළ සටහන්, වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති තෙරතුරුවලින් සමන්විත යූබී ෆිනෑන්ස් පීඑල්සී හි (සමාගම) මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අපි විගණනය සිදු කළෙමු.

සමාගමේ මූල්‍ය ප්‍රකාශනවලින් 2024 මාර්තු 31 දිනට සමාගමේ මූල්‍ය තත්ත්වය පිළිබඳ සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බවත් සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූල බවත් අපගේ මතය වේ.

මතය සඳහා පදනම

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව අපි විගණනය සිදුකළෙමු. මෙම විගණන ප්‍රමිති යටතේ වූ අපගේ වගකීම, අපගේ වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන කොටසේ විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය විසින් නිකුත් කළ වෘත්තීය ගණකාධිකාරීවරුන් සඳහා ආචාර ධර්ම සංග්‍රහයට (ආචාර ධර්ම සංග්‍රහය) අනුකූලව අපි සමාගමෙන් ස්වාධීන වන අතර, ආචාර ධර්ම සංග්‍රහයට අනුකූලව අපි අපගේ වෙනත් සදාචාර වගකීම් ඉටු කර ඇත. අපගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා අප විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව අපගේ විශ්වාශයයි.

ප්‍රධාන විගණන කරුණු

ප්‍රධාන විගණන කරුණු යනු, අපගේ වෘත්තීය විනිශ්චය අනුව, වත්මන් කාලපරිච්ඡේදයේ මූල්‍ය ප්‍රකාශයන් පිළිබඳ අපගේ විගණනය තුළ වඩාත් වැදගත් වූ කරුණු වේ. සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අපගේ විගණන සන්දර්භය තුළ සහ ඒ පිළිබඳව අපගේ මතය සැකසීමේදී මෙම කරුණු ආමන්ත්‍රණය කරන ලද අතර, මෙම කරුණු පිළිබඳව අපි වෙනම මතයක් ඉදිරිපත් නොකරමු. පහත සෑම කරුණක් සඳහාම, අපගේ විගණනය මෙම කාරණය ආමන්ත්‍රණය කළ ආකාරය පිළිබඳ විස්තරය එම සන්දර්භය තුළ සපයා ඇත.

මෙම කරුණුවලට සම්බන්ධතාව ඇතුළුව අපගේ වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන කොටසේ විගණනය සඳහා විගණකගේ වගකීම් තුළ විස්තර කර ඇති වගකීම් අපි ඉටු කර ඇත. ඒ අනුව, මූල්‍ය ප්‍රකාශනවල කරුණු අවප්‍රකාශයවීමේ අවදානම් පිළිබඳ අපගේ තක්සේරුවට ප්‍රතිචාර දැක්වීමට සැලසුම්කළ ක්‍රියාපටිපාටිවල කාර්යසාධනය අපගේ විගණනයට ඇතුළත්ය. පහත කරුණු ආමන්ත්‍රණය කිරීමට ඉටුකරන ලද ක්‍රියාපටිපාටි ඇතුළුව අපගේ විගණන ක්‍රියාපටිපාටිවල ප්‍රතිඵල අනුගාමී මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අපගේ විගණන මතය සඳහා පදනම ලබා දේ.

ප්‍රධාන විගණන කරුණු	අපගේ විගණනය ප්‍රධාන විගණන කරුණු ආමන්ත්‍රණය කළ අකාරය
ණය සහ අත්තිකාරම් සඳහා හානිකරණය රු. බිලියන 8.7 ක (සටහන 14) ණය හා අත්තිකාරම්වලින් ඇතිවූ රු.මිලියන 935 ක හානිකරණය පිළිබඳ සටහන 2.3.4 හි විස්තර කරන ගිණුම්කරණ ප්‍රතිපත්ති මත පදනම් වීම කළමනාකරණය විසින් තීරණය කරනු ලබයි. පහත හේතු නිසා මෙය ප්‍රධාන විගණන කරුණක් විය. ■ එවැනි මූල්‍ය වත්කම් ප්‍රතිසාධනයට අනාගත මූල්‍ය ප්‍රවාහ පිළිබඳ කළමනාකරණයේ අපේක්ෂාවන් හා බැඳුණු සැලකියයුතු කළමනාකරණ විනිශ්චයන්, උපකල්පන හා ඇස්තමේන්තු අවිනිශ්චිතතා මට්ටම සම්බන්ධ මැදිහත්වීම, සහ ■ ණය සහ අත්තිකාරම් මත හානිකරණය වාර්තාකළ ප්‍රමාණයේ ප්‍රමාණතාව සහ එය තීරණය කිරීම් තුළ සංකීර්ණ ගණනය කිරීම් භාවිතාව. කළමනාකරණය විසින් භාවිතාකළ සැලකියයුතු විනිශ්චයන්, උපකල්පන හා ඇස්තමේන්තු පිළිබඳ ප්‍රධාන ක්ෂේත්‍රවලට ඇස්තමේන්තු අවිනිශ්චිතතා පිළිබඳ ආවේනික වැඩිකළ මට්ටම්වලට යටත්වන උපකල්පිත අනාගත සිදුවීම් සහ/ හෝ ගනුදෙනු සිදුවීම සහ ඉදිරිය දකින සාර්ව-ආර්ථික ක්‍රියාදාම සහ ඒවාට අදාළ බරතැබීම් ඇතුළත්ය.	ණය සහ අත්තිකාරම් සඳහා හානිකරණයේ ප්‍රමාණතාව ආමන්ත්‍රණය කිරීමේදී, අපගේ විගණන ක්‍රියාපටිපාටිවලට පහත මූලික ක්‍රියාපටිපාටි ඇතුළත් වේ. ■ අපගේ වාර්තාවේ දිනය දක්වා ලබාගතහැකි මනා තොරතුරු මත පදනම් වී අපේක්ෂිත ණය අලාභ ගණනය කිරීම් සඳහා සමාගමේ දීමනාවල පෙළගැසීම සහ එහි ගිණුම්කරණ ප්‍රතිපත්ති සමඟ ආර්ථික කොන්දේසිවලට ප්‍රතිචාර ඇතුළුව පාදක වූ ක්‍රමවේදය තක්සේරු කරන ලදී. ■ අපේක්ෂිත ණය අලාභ ඇස්තමේන්තුව පිළිබඳ පාලනයන් හී සැලැස්ම, ක්‍රියාත්මක කිරීම සහ මෙහෙයුම් ඵලදායිත්වය තක්සේරු කරන ලද අතර මෙයට පාලන මට්ටම ඇගයීම, ණය සහ අත්තිකාරම් සඳහා හානිකරණය සමාලෝචනය සහ අනුමැතිය, අධ්‍යක්ෂ මණ්ඩලය සහ කළමනාකරණයේ ප්‍රතිපත්ති සහ ක්‍රියාපටිපාටි ඇතුළත්ය. ■ සමාගමේ අදාළ මූලාශ්‍ර ලියවිලි සහ ගිණුම්කරණ වාර්තා හරස් පිරික්සුම මඟින් ණය සහ අත්තිකාරම් සඳහා හානිකරණය ගණනය කිරීම් තුළ භාවිතාකළ පාදක දත්තවල සම්පූර්ණත්වය, නිරවද්‍යතාව සහ සාධාරණත්වය පරීක්ෂා කරන ලදී. ■ ණයවල තත්ත්වය පිළිබඳ තක්සේරු කිරීම් හා අදාළ අදියර වර්ගීකරණවල සාධාරණත්වය තක්සේරු කරන ලදී. ■ මුදල් ප්‍රවාහ පුරෝකථනවල වටිනාකම සහ කාලය, ඇපවල අයකිරීමේ ක්‍රියාවල තත්ත්වය, ඉදිරිය දකින සාර්ව-ආර්ථික ක්‍රියාදාම සහ ඒවාට අදාළ බරතැබීම් ඇතුළුව සිදුවීම් සහ/ හෝ ගනුදෙනුවල උපකල්පිත අනාගත සිදුවීම් තුළ කළමනාකරණය විසින් භාවිතාකළ විනිශ්චයන්, උපකල්පන හා ඇස්තමේන්තුවල සාධාරණත්වය තක්සේරු කරන ලදී. ■ අපි මූල්‍ය ප්‍රකාශනවලට සටහන් 14 හි දක්වා ඇති අදාළ මූල්‍ය ප්‍රකාශන අනාවරණවල ප්‍රමාණතාව ඇගයීමට ලක් කළෙමු.
මූල්‍ය වාර්තාකරණය පිළිබඳ තොරතුරු තාක්ෂණ පද්ධති ආශ්‍රිත අභ්‍යන්තර පාලනයන් සමාගමේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය විවිධ තොරතුරු තාක්ෂණ පද්ධති හා අදාළ අභ්‍යන්තර පාලනයන් කෙරෙහි සැලකියයුතු ලෙස විශ්වාසය තබා ඇත. තවද, ප්‍රධාන මූල්‍ය ප්‍රකාශන අනාවරණ තොරතුරු තාක්ෂණ පද්ධති මගින් උත්පාදිත දත්ත සහ වාර්තා භාවිතයෙන් පිළියෙල කරන අතර එය පැතුරුම්පත් භාවිතයෙන් සම්පාදනය කර සකස් කෙරේ. ඒ අනුව, මූල්‍ය වාර්තාකරණය පිළිබඳ තොරතුරු තාක්ෂණ පද්ධති ආශ්‍රිත අභ්‍යන්තර පාලනයන් ප්‍රධාන විගණන කාර්යයක් ලෙස සලකන ලදී.	අපගේ විගණන ක්‍රියාපටිපාටිවලට පහත මූලික ක්‍රියාපටිපාටි ඇතුළත් වේ ■ අපි අදාළ සැලකියයුතු ක්‍රියාවලින් හී අභ්‍යන්තර පාලන වාතාවරණය පිළිබඳ අවබෝධයක් ලබා ගෙන මූල්‍ය වාර්තාකරණය සහ අදාළ ආනාවරණවලට අදාළ ප්‍රධාන පාලනයන් පරීක්ෂා කර ඇත. ■ අපගේ අභ්‍යන්තර විශේෂිත සම්පත් සම්බන්ධ කරමින් ■ සමාගමේ තොරතුරු තාක්ෂණ පාලන ව්‍යුහය පිළිබඳ අවබෝධයක් ලබා ගෙන ඇත. ■ අපි පරිශීලක ප්‍රවේශ සහ වෙනස කළමනාකරණයට අදාළ මූල්‍ය වාර්තාකරණය පිළිබඳ තොරතුරු තාක්ෂණ පද්ධති ආශ්‍රිත අභ්‍යන්තර පාලනයන්හි සැලැස්ම සහ මෙහෙයුම් ඵලදායිත්වය හඳුනාගෙන, ඇගයීමට ලක් කර පරීක්ෂා කළෙමු. ■ සමාගමට අදාළ සයිබර් ආරක්ෂක අවදානම් සහ සයිබර් ආරක්ෂක අවදානම් ආමන්ත්‍රණය කිරීමට ක්‍රියාත්මක කළ ක්‍රියාවලි සහ පාලනයන්ට අදාළ විමසුම් තුළින් මෙවැනි අවදානම් මූලිකවම විසඳීමට ගනු ලැබූ ක්‍රියාමාර්ග පිළිබඳ ඉහළ-මට්ටමේ අවබෝධයක් ලබා ගෙන ඇත. අපි නිරවද්‍යතාව සහ සම්පූර්ණත්වය සඳහා අනාවරණ උත්පාදනය කිරීමට භාවිතා කළ වාර්තාවල මූලාශ්‍ර දත්ත පරීක්ෂා කළෙමු.

සමාගමේ 2024 වාර්ෂික වාර්තාව තුළ ඇතුළත් කර ඇති වෙනත් තොරතුරු

මූල්‍ය ප්‍රකාශන සහ එහි අපගේ විගණන වාර්තාව හැර වාර්ෂික වාර්තාවේ ඇතුළත් කර ඇති තොරතුරුවලින් අනෙකුත් තොරතුරු සමන්විත වේ. අනෙකුත් තොරතුරු සඳහා කළමනාකරණය වගකීමට බැඳී සිටී.

මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අපගේ මතයෙන් අනෙකුත් තොරතුරු ආවරණය නොකරන අතර එහි අන්තර්ගතය පිළිබඳව කිසිදු සහතික කරන අදහසක් අපි ප්‍රකාශ නොකරමු.

මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අපගේ විගණනය සම්බන්ධයෙන්, අපගේ වගකීම වන්නේ අනෙකුත් තොරතුරු ලබාගැනීමට හැකි අවස්ථාවේදී හඳුනාගනු ලබන තොරතුරු කියවීම වන අතර, එසේ කරමින් අනෙකුත් තොරතුරු මූල්‍ය ප්‍රකාශන සමඟ සැලකියයුතු ලෙස නොගැලපේද යන්න සහ විගණනය තුළ හෝ වෙනත් ආකාරයකින් ලබාගත් අපගේ දැනුම සැලකියයුතු ලෙස වැරදියට සඳහන් කර ඇති බව පෙන්නුම් කරන්නේද යන්න සලකා බැලීමයි. අපි ඉටුකළ කාර්යය මත පදනම්ව, මෙම වෙනත් තොරතුරුවල වැදගත් අවප්‍රකාශ ඇති බව අපි පවසන්නෙමු, නිවැරදි කිරීම පිණිස පාලනය සඳහා වගකියන අය වෙත එම කරුණු දැනුම් දීම අවශ්‍ය වේ. මේ සම්බන්ධයෙන් වාර්තා කිරීමට කිසිවක් නොමැත.

මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශ්වයන්ගේ වගකීම්

ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ දැක්මක් ලබාදෙන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සඳහා සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යයයි කළමනාකරණය තීරණය කරන අභ්‍යන්තර පාලනයන් සඳහා කළමනාකරණය වගකීමට බැඳී සිටී.
මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, අඛණ්ඩ පැවැත්මක් ලෙස පවත්වා ගෙන යාමේ සමූහයේ හැකියාව තක්සේරු කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය සමූහය ඈවර කිරීමට අදහස් කරන්නේ නම්, හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා සමූහයේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

සමාගමේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශ්වයන් විසින් දරනු ලබයි.

මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ අපගේ මතය ඇතුළත් විගණකගේ වාර්තාව නිකුත් කිරීම අපගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතික වීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදුකිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක අව ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි බලපෑමක් ඇති විය හැකි බවට අපේක්ෂා කෙරේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයක කොටසක් ලෙස, අපි විසින් විගණනය තුළ වෘත්තීය විනිශ්චය ක්‍රියාත්මක කළ අතර වෘත්තීය සැක මුසු බව පවත්වා ගනු ලැබිය. තවද,

- ■ වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගේ අවදානම් හඳුනාගෙන හා තක්සේරු කර, එම අවදානම්වලට ප්‍රතිචාරාත්මකව විගණන පටිපාටි සැලසුම් කර ඉටු කරමින් අපගේ විගණනය සඳහා පදනමක් ලබා ගැනීමට ප්‍රමාණවත් සහ සුදුසු විගණන සාක්ෂි අපි ලබාගතිමු. වංචාවකින් ඇතිවන වැදගත් සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් සොයා නොගැනීමේ අවදානම දෝෂයෙන් සිදුවන බලපෑමට වඩා ඉහළ වන අතර, වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ, වංචාව දුස්සන්ධානය, ව්‍යාජ ලේඛණ සැකසීම, චේතනාන්විත මඟහැරීම හෝ අභ්‍යන්තර පාලනයන් මඟහැරීම වංචාවක් ඇතිවීමට සම්බන්ධවන බැවිනි.
- ■ අවස්ථානෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීම පිණිස සමාගමේ අභ්‍යන්තර පාලනය සම්බන්ධයෙන් අවබෝධයක් ලබගන්නා ලද නමුත්, සමාගමේ අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අපි අදහස් නොකරමු.
- ■ භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල සහ කළමනාකරණය විසින් කරන ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ අදාළ හෙළිදරව් කිරීම්වල යෝග්‍යතාවය ඇගයීමට ලක් කළෙමු.
- ■ සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම කළමනාකරණය විසින් යොදාගැනීමේ අදාළත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට අපි නිගමනය කරන්නේ නම්, මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව් කිරීම්වලට අපගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව් කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් අපගේ මතය විකරණය කළ යුතුය. අපගේ නිගමනයන් අපගේ විගණන වාර්තාවේ දිනය දක්වා ලබාගෙන ඇති විගණන සාක්ෂිය මත පදනම් වේ. කෙසේවුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත සමාගමේ අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.
- ■ හෙළිදරව් කිරීම් ඇතුළු මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම, ව්‍යුහය සහ අන්තර්ගතය ඇගයීමට ලක් කළ අතර මූල්‍ය ප්‍රකාශන එයට පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් සාධාරණ ඉදිරිපත් කිරීම සාක්ෂාත් කර ගන්නා ආකාරයෙන් නියෝජනය කරන්නේද යන්න අගයන ලදී.

අපගේ විගණනය තුළ වෙනත් කරුණු අතර අප හඳුනා ගන්නා අභ්‍යන්තර පාලනයේ කිසියම් සැලකියයුතු දුර්වලතා ඇතුළුව, විගණනයේ සැලසුම්ගත විෂයපථය සහ කාලසීමාව සහ සැලකියයුතු විගණන සොයාගැනීම් සම්බන්ධයෙන් අපි පාලනය සම්බන්ධයෙන් වගකීමට බැඳී ඇති අය සමඟ සන්නිවේදනය කරන්නෙමු.

අපි ස්වාධීනත්වය සම්බන්ධ අදාළ ආචාරධර්ම අවශ්‍යතාවලට අනුකූලව කටයුතු කර ඇති බවට සහ අපගේ ස්වාධීනත්වය මත සාධාරණ ලෙස සිතිය හැකි සියලු සබඳතා සහ වෙනත් කරුණු ඔවුන් සමඟ සන්නිවේදනය කිරීමට සහ අදාළ අවස්ථාවලදී තර්ජන ඉවත් කිරීමට ගනු ලැබූ ක්‍රියාමාර්ග හෝ යොදාගත් ආරක්ෂාවන් පිළිබඳ ප්‍රකාශයක් පාලනය සම්බන්ධයෙන් වගකීමට බැඳී ඇති අයට ලබා දෙන්නෙමු.
පාලනය සම්බන්ධයෙන් වගකීමට බැඳී ඇති අය සමඟ සන්නිවේදනය කළ කරුණුවල සිට, පවත්නා කාලසීමාවේ මූල්‍ය ප්‍රකාශ පිළිබඳ විගණනය තුළ වඩාත් වැදගත් වූ කරුණු එම නිසාම ප්‍රධාන විගණන කරුණු බව අපි තීරණය කරමු. අපි මෙම කරුණු අපගේ විගණක වාර්තාවේ විස්තර කරන්නේ නීතිය හෝ රෙගුලාසි මගින් එම කාරණය පිළිබඳ ප්‍රසිද්ධ අනාවරණ කිරීම වළක්වන්නේ නම් හෝ අතිශය දුර්ලභ අවස්ථාවන්හිදී, අපගේ වාර්තාවේ යම් කරුණක් සන්නිවේදනය නොකළ යුතු යැයි අපි තීරණය කරන්නේ එසේ කිරීමෙන් අහිතකර ප්‍රතිවිපාක සාධාරණ ලෙස අපේක්ෂා කළ හැකි බැවිනි.

වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2007 අංක 07 දරන සමාගම් පනතේ 163 (2) වගන්තිය අනුව, විගණනය සඳහා අවශ්‍ය වූ සියලුම තොරතුරු මෙන්ම පැහැදිලි කිරීම් අපි ලබා ගත් අතර, අපගේ පරීක්ෂණයෙන් පෙනෙන පරිදි, විධිමත් ගිණුම්කරණ වාර්තා සමාගම විසින් තබා ගෙන ඇත.

මෙම ස්වාධීන විගණකගේ වාර්තාව අත්සන් කිරීම සඳහා වගකියන සහභාගිත්ව හවුල්කරුගේ ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනයේ සාමාජිකත්ව අංකය 3755 වේ.

(අත්සන් කළේ)
අර්නස්ට් ඇන්ඩ් යංග්
2024 ජූනි 26
කොළඹ

Partners: DK Hulangamuwa FCA FCMA LLB (London), A P A Gunasekara FCA FCMA, Ms. Y A De Silva FCA, Ms. G G S Manatunga FCA, W K B S P Fernando FCA FCMA, B E Wijesuriya FCA FCMA, R N de Saram ACA FCMA, Ms. N A De Silva FCA, N M Sulaiman ACA ACMA, Ms. L K H L Fonseka FCA, Ms. P V K N Sajeewani FCA, A A J R Perera FCA ACMA, N Y R L Fernando ACA, D N Gamage ACA ACMA, C A Yalagala ACA ACMA

Principals: T P M Ruberu FCMA FCCA MBA (USJ-SL), G B Goudian ACMA, Ms. P S Paranavitane ACA ACMA LLB (Colombo), D L B Karunathilaka ACMA, W S J De Silva Bsc (Hons) - MIS Msc - IT, V Shakthivel B.Com (Sp)

A member firm of Ernst & Young Global Limited

ලාභ අලාභ ප්‍රකාශය (විගණනය කළ)

2024 මාර්තු 31 අවසන් වූ වර්ෂය සඳහා රුපියල් ('000)	**2024**	**2023**
ආදායම්	2,299,980.0	2,126,638.5
පොලී ආදායම	2,142,755.0	2,013,354.1
පොලී වියදම්	(1,399,295.6)	(1,274,402.1)
ශුද්ධ පොලී ආදායම	743,459.4	738,952.1
ගාස්තු සහ කොමිස් ආදායම	62,975.6	47,700.7
ගාස්තු හා කොමිස් වියදම	(17,230.8)	(11,841.5)
ශුද්ධ ගාස්තු හා කොමිස් ආදායම	45,744.9	35,859.1
වෙනත් මෙහෙයුම් ආදායම් (ශුද්ධ)	94,249.4	65,583.7
මුළු මෙහෙයුම් ආදායම	883,453.7	840,394.9
ණය සහ අත්තිකාරම් සහ වෙනත් වත්කම් මත හානිකරණය	(59,170.9)	(332,659.2)
ශුද්ධ මෙහෙයුම් ආදායම	824,282.8	507,735.8
පුද්ගල වියදම්	(291,447.2)	(270,018.2)
දේපල, පිරියත හා උපකරණ ක්ෂය වීම	(59,401.3)	(52,938.3)
අස්පෘශ්‍ය වත්කම් ක්‍රමක්ෂ කිරීම	(1,825.5)	(2,142.3)
වෙනත් වියදම්	(332,403.7)	(256,434.3)
මූල්‍ය සේවා මත බදු ගෙවීමට පෙර මෙහෙයුම් ලාභය	139,205.1	(73,797.4)
මූල්‍ය සේවා මත එකතු කල අගය මත බදු	(68,181.6)	(37,306.0)
සමාජ අරක්‍ෂණ දායකත්ව බදු	(9,469.7)	(2,349.8)
බදු ගෙවීමට පෙර ලාභය / (අලාභය)	61,553.8	(113,453.2)
ආදායම් බදු වියදම්	(60,081.5)	-
වසර සඳහා ලාභය / (අලාභය)	1,472.2	(113,453.2)
කොටසකට ඉපැයීම්: මූලික	0.001	(0.042)

විස්තීර්ණ ආදායම් ප්‍රකාශය (විගණනය කළ)

2024 මාර්තු 31 අවසන් වූ වර්ෂය සඳහා රුපියල් ('000)	**2024**	**2023**
වසර සඳහා ලාභය	1,472.2	(113,453.2)
ආදායම් ප්‍රකාශනයට නැවත වර්ග කෙරෙන වෙනත් විස්තීර්ණ ආදායම්		
ආදායම් ප්‍රකාශනයට නැවත වර්ගීකරණය නොකරන වෙනත් විස්තීර්ණ ආදායම		
ප්‍රත්‍යාගණනය කරන ලද ඉඩම් සහ ගොඩනැගිලි මත ලාභය	66,657.5	-
බදු ප්‍රතිශත වෙනස්වීමට අනුකූලව ප්‍රත්‍යාගණන සංචිත මත විලම්බිත බදු	(19,997.3)	(3,608.0)
කොටස්වල ආයෝජනය කිරීම මත ලාභය	9,654.5	124.7
කොටස්වල ආයෝජනය කිරීම මත විලම්බිත බදු	(2,896.3)	(37.4)
විශ්‍රාම ප්‍රතිලාභ බැදීම මත ආයුගණනය මත ලාභ / (අලාභ)	136.6	487.8
ඉහත ආයු ගණනය අයකිරීම් / ආපසු හැරවීම් ගැලපීම මත විලම්භිත බදු	(41.0)	(146.4)
බදු ප්‍රතිශත වෙනස්වීම මත විලම්බිත බදු බලපෑම	-	-
වර්ශය සඳහා මුළු විස්තීර්ණ ආදායම බදු ශුද්ධ	53,514.0	(3,179.2)
වර්ෂය සඳහා මුළු විස්තීර්ණ ආදායම	54,986.3	(116,632.5)

ප්‍රධාන කාර්ය සාධන දර්ශක

අයිතමය	2024 / 03 / 31 දිනට		2023 / 03 / 31 දිනට	
නියාමන ප්‍රාග්ධන ප්‍රමාණාත්මකතාවය (%)	තථ්‍ය	අවශ්‍ය	තථ්‍ය	අවශ්‍ය
1 වන ස්ථරයේ ප්‍රාග්ධන ප්‍රමාණාත්මකතා අනුපාතය	30.5%	8.5%	31.1%	8.5%
මුළු ප්‍රාග්ධන ප්‍රමාණාත්මකතා අනුපාතය	30.5%	12.5%	31.1%	12.5%
අරමුදල් ප්‍රාග්ධනයට තැන්පතු වගකීම් අනුපාතය	31.9%	10.0%	39.0%	10.0%
ණය කලඹේ ගුණාත්මකතාවය (%)				
දළ අදියර 3 ණය අනුපාතය**	26.1%		32.5%	
ශුද්ධ අදියර 3 ණය අනුපාතය**	16.6%		24.3%	
ශුද්ධ අදියර 3 ණයට මූලික ප්‍රාග්ධන අනුපාතය**	62.0%		92.0%	
(**අදියර 3 ණය වර්ගීකරණය 2022/23 වර්ෂය හා සැසඳීමේදී 2023/24 වර්ෂයේදී දින 120 සිට දින 90 දක්වා වෙනස් වීමට භාජනය වී ඇත)				
අදියර 3 හානිකරණ ආවරණ අනුපාතය	36.2%		25.2%	
මුළු හානිකරණ ආවරණ අනුපාතය	12.1%		11.7%	
ලාභදායීත්වය (%)				
ශුද්ධ පොලි ආන්තිකය	7.2%		7.1%	
වත්කම් මත ප්‍රතිලාභ (බදු පෙර)	1.3%		-0.7%	
හිමිකම් මත ප්‍රතිලාභ (බදු පසු)	0.1%		-4.2%	
ආදායම් මත පිරිවැය අනුපාතය	78.0%		69.6%	
ද්‍රවශීලතාවය (%)				
පවතින ද්‍රවශීල වත්කම්වලට ද්‍රවශීල වත්කම් අවශ්‍යතා අනුපාතය (අවම 100%)	300.3%		196.4%	
ද්‍රවශීල වත්කම් වලට බාහිර අරමුදල් අනුපාතය	30.1%		18.3%	
නාමික තොරතුරු				
ශාඛා ගණන	17		17	
බාහිර ණය ශ්‍රේණිය	"BB(lka)"		"BB(lka)" - RWN	
නියාමන අධිකාරියක් විසින් පසුගිය මාස 6 තුල පනවා ඇති දඩ				
ප්‍රමාණය (රුපියල් මිලියන)	-		-	
නියාමන තැන්පතු මත සීමා පැනවීම්				
මුළු තැන්පතු සඳහා උපරිම සීමාව (රු. මිලියන)	7,500		-	
නියාමන ණයදීම් මත සීමා පැනවීම්				
මුළු ණය කළඹ සඳහා උපරිම සීමාව (රුපියල් මිලියන)	-		-	

මූල්‍ය තත්ත්ව ප්‍රකාශය (විගණනය කළ)

2024 මාර්තු 31 දිනට රුපියල් ('000)	**2024**	**2023**
වත්කම්		
අත ඉතිරි මුදල් සහ බැංකුවේ ශේෂය	229,038.5	510,336.6
ක්‍රමක්ෂය පිරිවැයට මූල්‍ය ආයොජනය	2,130,830.0	848,057.9
ක්‍රමක්ෂය පිරිවැයට මූල්‍ය වත්කම් - ණුදෙනුකරුවන්ගේ ණය සහ අත්තිකාරම්	7,760,662.2	8,088,941.8
වෙනත් විස්තීර්ණ ආදායම් තුලින් සාධාරණ අගයට මූල්‍ය වත්කම්	31,512.7	21,858.2
දේපල වල ආයෝජනය	60,055.6	75,487.1
වෙනත් වත්කම්	153,255.8	75,623.2
අස්පෘෂ්‍ය වත්කම්	9,197.0	6,481.0
දේපල පිරියත සහ උපකරණ	529,252.4	333,358.0
විලම්බිත බදු වත්කම්	63,363.8	146,380.0
	10,967,168.1	10,106,523.8
වගකීම්		
ක්‍රමක්ෂය පිරිවැයට මූල්‍ය වගකීම්		
බැංකු වෙත ගෙවිය යුතු	20,742.0	15,388.7
වෙනත් ගනුදෙනුකරුවන්ට ගෙවිය යුතු	7,527,534.0	6,508,959.1
වෙනත් ණය ගැනීම්	-	481,130.1
මූල්‍ය වගකීම්	514,740.5	279,650.6
වෙනත් මූල්‍ය නොවන වගකීම්	66,129.5	100,085.6
විශ්‍රාම ප්‍රතිලාභ වගකීම්	33,360.2	26,634.2
මුළු වගකීම්	8,162,506.2	7,411,848.2
ස්කන්ධය		
ප්‍රාකාශිත ප්‍රාග්ධනය	3,071,482.2	3,016,482.2
ව්‍යවස්ථාපිත සංචිත අරමුදල	72,061.4	71,987.8
සාධාරන අගය මත සංචිතය	23,210.2	16,452.1
ප්‍රාත්‍යාගණන සංචිතය	95,689.5	49,029.2
නියාමන පාඩු දීමනා සංචිතය	281,020.7	92,549.0
සමුච්චිත අලාභ	(738,802.1)	(551,824.7)
කොටස් හිමියන්ගේ මුළු ස්කන්ධය	2,804,661.9	2,694,675.6
මුළු ස්කන්ධය සහ වගකීම්	10,967,168.1	10,106,523.8

මෙම මූල්‍ය ප්‍රකාශන 2007 අංක 07 දරන සමාගම් පනතේ අවශ්‍යතාවලට අනුකූල වන බව සහතික කරමි

(අත්සන)
අසංක උඩුගම
නියෝජ්‍යය සාමාන්‍යාධිකාරී - මූල්‍ය

මෙම මූල්‍ය ප්‍රකාශන සඳහා අධ්‍යක්ෂ මණ්ඩලය වගකීමෙන් බැඳේ අධ්‍යක්ෂ මණ්ඩලය සඳහා සහ ඒ වෙනුවෙන් අත්සන් කරන ලද්දේ

(අත්සන)
මැලේ මුකර්ජි
සභාපති

(අත්සන)
රන්සිත් කරුණාරත්න
අධ්‍යක්‍ෂ/ප්‍රධාන විධායක නිලධාරී

2024 ජූනි 26 කොළඹදී

UB FINANCE
A UNIONBANK COMPANY

යූබී ෆිනෑන්ස් පීඑල්සී (PQ 00283806), නො:10, ඩේසි විලා පටුමග, කොළඹ 04. දුරකථන. +94 114 468 888 ෆැක්ස් +94 112 508 517 විද්‍යුත් info@ubf.lk වෙබ් ubf.lk